**මොරටුව විශ්වවිද්‍යාලය - 2017**

**--------------------------------**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු

-----------------------------------------------

විශ්වවිද්‍යාලය සිය පර්යේෂණ තුලින් සිදු කරනු ලබන නව සොයාගැනීම්වල අයිතිය කෝඩ්ජෙන් ඉන්ටනැෂනල් පුද්ගලික සමාගමට සම්පූර්ණයෙන් පැවරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය සමග ඇතිකර ගත් ගිවිසුම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

රාජ්‍ය ප්‍රදාන උපයෝගී කරගෙන මිලදී ගන්නා වත්කම් හා පරිත්‍යාග ලෙස ලැබෙන වත්කම්වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමානුකූල පදනමකට රාජ්‍ය ප්‍රදාන හා පරිත්‍යාග විලම්භිත ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත්, විශ්වවිද්‍යාලය විසින් ඊට පටහැනි ලෙස ප්‍රාග්ධන ප්‍රදාන, පරිත්‍යාග හා උත්පාදිත අරමුදල් සියයට 10 කින් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග හා උත්පාදිත අරමුදල් වලින් මිලදී ගත් වත්කම්වල වටිනාකමින් සියයට 10 බැගින් පිළිවෙලින් රු.81,085,033 ක් හා රු.7,397,820 ක් විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාස්තු විද්‍යා ගොඩනැගිල්ලේ අදියර IV ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු. 1,005,799 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු රු.667,104,496 ක් වටිනාකමැති නේවාසිකාගාර ගොඩනැගිල්ල භාවිතා කිරීමට සුදුසු තත්ත්වයට පත්වූ දින සිට ක්ෂය කළයුතු වුවද 2017 වර්ෂයට අදාල ක්ෂය ගැලපුම් සිදුකර නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.4,366,962,846 ක් වූ වත්කම් පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති තක්සේරු වාර්තාවන්හි, වත්කම්වල ඉදිරි ඵලදායී ජීවිත කාලය සඳහන් කර නොතිබීම නිසා තක්සේරු කළ වත්කමෙහි ආරම්භක අවස්ථාවෙහි සලකන ලද ඵලදායී ජීවිත කාලය මත පදනම්ව ක්ෂය කර තිබුණි.

(ඇ) උපාධි ලෝගු, මාල හා හිස්වැසුම් යන අයිතම එක් ගිණුමක දක්වා තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ සම්පූර්ණ ශේෂය ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව මාල සහ හිස්වැසුම්වල වටිනාකම පමණක් රු.1,724,300 ක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබුණි. එමෙන්ම 2013 වර්ෂයේදී එම ගිණුමේ සම්පූර්ණ ශේෂය ප්‍රත්‍යාගණන ගිණුමට ගෙන තිබීම හේතුවෙන් උපාධි ලෝගුවල වටිනාකම 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වලින් සම්පූර්ණයෙන් අත්හැරී තිබුණි. තවද උපාධි මාල සහ හිස්වැසුම්වල නව ප්‍රත්‍යාගණිත වටිනාකම වූ රු.1,724,300 වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.344,860 ක් ක්ෂය කළයුතු වුවත් ඒ සඳහා ගැලපීම් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ආයෝජනය කරන ලද රු. 70,000,000 ක් ආයෝජන ගිණුමට හරකිරීම වෙනුවට උපදේශක සේවා සංචිත අරමුදල් ගිණුමට හරකර තිබුණි. එම ආයෝජන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.253,290 ක පොළිය ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් අනුව වාස්තු විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ IV වන අදියර (Building for Faculty of Architecture Phase IV) සඳහා වූ නොනිමි වැඩ වටිනාකම රු.97,216,592 ක් වුවද මූලධන කටයුතු අංශයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම වටිනාකම රු.98,198,390 ක් වූයෙන් රු.981,798 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් තුනක ක්ෂය වෙන්කිරීම් ශේෂය රු.654,903,732 ක් වුවද ලෙජර් ගිණුම් අනුව එම වටිනාකම රු.683,684,440 ක් වූයෙන් රු.28,780,708 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට ගබඩා තොග ශේෂය රු.16,018,174 ක් වුවද උපලේඛන අනුව එම ශේෂය රු.15,759,988 ක් වූයෙන් රු.258,186 ක් වෙනසක් පැවතුණි.

(ඈ) රාජ්‍ය ප්‍රදාන පදනම් කරගනිමින් මිලදී ගන්නා ලද වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය රු.569,749,583 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය ලෙස රු.577,147,403 ක් කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගැනීම හේතුවෙන් රු.7,397,820 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

විදුලි උත්පාදන යන්ත්‍ර 07 ක් මිලදී ගැනීමට අදාලව ලිපිගොනු හා මූලික ලියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම යන්ත්‍ර කුමන දිනයක ස්ථාපිත කළේද යන්න හඳුනාගත නොහැකි විය. එසේම 2018 අගෝස්තු 24 දින වනවිටත් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් 31 දෙනෙකු අදාළ ගිවිසුම් කඩකර තිබුණු අතර 2018 ජූලි 25 දින වන විට ඉන් 29 දෙනෙකුගෙන් එකතුව රු. 51,788,857 ක මුදලක් අයවියයුතුව පැවතුණි. ඉතිරි ආචාර්යවරුන් දෙදෙනාගෙන් අයකරගත යුතු වටිනාකම ගණනය කර නොතිබුණි. ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් අයවියයුතු එකතුව රු.7,573,815 ක් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීම සඳහා අදාළ ආචාර්යවරුන් වසර දෙකකට වැඩි කාලයක සිට

එකඟතාවය ලබාදී තිබුණ ද එම මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. එමෙන්ම වසර 10 කට වැඩි කාලයක සිට ආචාර්යවරුන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,473,002 ක මුදලක් අයකර ගැනීම සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත 3 (ආ) වගන්තිය | විශ්වවිද්‍යාලයේ ස්වයං මූල්‍යායන කටයුතු වලින් උත්පාදිත ආදායම් මත 2017/18 වර්ෂයේ දෙවන හා තුන්වන කාර්තු වෙනුවෙන් ආර්ථික සේවා ගාස්තුව රු.809,834 ක් අඩුවෙන් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 128 | ආයතනයක ගණන් දීමේ නිලධාරියා මූල්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳෙන අතර මුදල් ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යනබවට හා එම ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කලට සෝදිසි කරන බවටද වගබලා ගත යුතුය. එසේ වුවද නිසි අධීක්ෂණය නොමැති වීම හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් ලංකා බැංකුවේ පවත්වාගෙන යන අංක 306795 දරන ජංගම ගිණුමට අදාලව මුදල් පොත හා බැංකු සැසඳුම් ප්‍රකාශ සම්මත අයුරින් පිළියෙලකර නොතිබුණු අතර බැංකු ප්‍රකාශනයේ ගනුදෙනු පදනම් කරගෙන මුදල් පොත පිළියෙල කිරීම පමණක් සිදුකර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 507 (1) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.16,506,308 ක් වූ තොග වටිනාකම තුළ විශ්වවිද්‍යාලයෙහි නඩත්තු අංශය සතුව පැවති තොගය ඇතුළත් කර නොතිබුණු අතර නඩත්තු ගබඩාව 2017 දෙසැම්බර් 31 දිනට තොග සත්‍යාපනයක් ද සිදුකර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක CSA/81/40 හා 2007 පෙබරවාරි 28 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය විසින් චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස එකතුව රු. 3,871,682 ක මුදලක් රැස්වීම්, සම්මන්ත්‍රණ වැඩමුළු ආදිය පැවැත්වීම සඳහා ආහාරපාන සහ නවාතැන් ගාස්තු වෙනුවෙන් හෝටල් වෙත ගෙවා තිබුණි. |

(ඈ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | ආයතනය සතුව පවතින රු.9,886,061,960 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | ආයතනය සතු පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ යටතේ 2015 සැප්තැම්බර් 16 දිනැති අංක 13/2015 දරන ආයතන චක්‍රලේඛ ලිපිය | විශ්වවිද්‍යාලයේ නිල වාහන ලබාදෙනු ලබන නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතු කර ගෙවීම් කළයුතු වුවද 2017 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් මස දක්වා නිලධාරීන් 10 දෙනෙකුට එකතුව රු.752,926 ක මුදලක් ඉන්ධන දීමනා ලෙස මුදලින් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 58,682,610 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 229,602,809 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.170,920,199 ක වර්ධනයක් පැවතුණි. වර්ෂයේ ආදායම රු.543.679.722 කින් වැඩිවී තිබුණද වියදම රු.372,759,523 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.64,407,671 ක් වූ ඌනතාවය 2014 වර්ෂය දක්වා අඛණ්ඩව පිරිහී 2015 වර්ෂයේදී නැවත වර්ධනයක් දක්නට ලැබුණ ද 2016 වර්ෂයේදී රු. 229,602,809 ක් දක්වා පිරිහීමක් දක්නට ලැබුණු අතර 2017 වර්ෂයේ නැවත වර්ධනයවී රු. 58,682,611ක ඌණතාවයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.665,988,174 ක් වූ විශ්වවිද්‍යාලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,538,431,528 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

------------------------------------------------------------------------------------

විශ්වවිද්‍යාලය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපැලක් ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම බාහිර හා අභ්‍යන්තර පාර්ශවකරුවන් 06 දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණවල නඩු පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------------**

**4.1 කාර්යසාධනය**

**-----------------**

**4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා අයවැය මගින් පර්යේෂණ ප්‍රදාන සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 40 ක ප්‍රතිපාදනය රු.මිලියන 55 ක් දක්වා පසුව සංශෝධනය කර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට එම සීමාව ඉක්මවා රු.12,700,127 ක් වැයකර තිබුණි.

(ආ) 2017 වර්ෂය තුළ අවම වශයෙන් එක් පර්යේෂණ ව්‍යාපෘතියක හෝ නිරතවූ පර්යේෂණ ප්‍රදානලාභීන් ගණන 72 ක් විය. සනාතන සභා පර්යේෂණ කමිටුව විසින් 2017 දෙසැම්බර් 31 දින වනවිට අනුමත කර තිබුණු පර්යේෂණ 169 ක් අතරින් 30 ක නියැදියක් පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේදී නිමකළ යුතුව තිබූ එකතුව රු.12,385,150 ක් වූ පර්යේෂණ 14 ක් නිමකර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් වලදී අදාල කරගන්නා වෙබෝ මෙට්‍රික් නිර්ණායකයන් අනුව විශ්වවිද්‍යාලය තුළින් උත්පාදිත දැනුම වර්ධනයට පර්යේෂණයන්ගේ දායකත්වය ඉහළ විය යුතු අතර ඒ අනුව වාර්ෂිකව සිදුකරන පර්යේෂණයන් විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් අතර මට්ටම තීරණය කිරීමට බලපානු ලබයි. සෑම වර්ෂයකම ජනවාරි සහ ජූලි මාසවල සිදුකරනු ලබන ලෝක ශ්‍රේණිගත කිරීම් වලට අනුව මොරටුව විශ්වවිද්‍යාලය 2017 වර්ෂයේ පිළිවෙලින් 2647 ස්ථානයේ හා 2681 ස්ථානයේ වූ අතර 2018 වර්ෂයේ එම ස්ථාන පිළිවෙලින් 2809 හා 2717 ක් වී තිබුණි.

(ඈ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව විශ්වවිද්‍යාලයීය දේශීය හා විදේශීය සිසුන් පර්යේෂණවල නිරත වීමට අපේක්ෂිත සංඛ්‍යාව පිළිවෙලින් 350 ක් හා 15 ක් වුවද එයින් දේශීය සිසුන් 108 ක් පමණක් පර්යේෂණවල නිරතවී තිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරිපත් කර ඇති දත්තයන්ට අනුව, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පර්යේෂණවල නිරත දේශීය හා විදේශීය සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 61 ක් හා සියයට 100 ක පසු බෑමක් නිරූපණය විය. එමෙන්ම වාර්ෂික පර්යේෂණ ඇගයීම් ක්‍රියාවලියේ සිදුවන ප්‍රමාදයද පර්යේෂකයින් අධෛර්යමත් වීමට හේතුවී තිබුණි.

(ඉ) පර්යේෂණවල නිරත වන්නන් සවිබල ගැන්වීම සඳහා 2017 වර්ෂය තුළ රුපියල් මිලියනයක ප්‍රතිපාදන යටතේ පුහුණුවීම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණද, එම කාර්ය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) 2015 නොවැම්බර් 17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපි අංක 15/2015 ප්‍රකාරව විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන විභාගයන්හි ප්‍රතිඵල මාස 03 ක කාලයක් තුළ නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අභ්‍යන්තර විභාග 169 කින් ප්‍රතිඵල ලබා නොදුන් විභාග 6 ක් වන අතර විභාග 90 ක ප්‍රතිඵල නිකුත් කිරීම මාස 3 ඉක්මවා ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය.ඒ අනුව පුතිඵල ලබා නොදීම, සමස්තයක් ලෙස ගත් කළ ප්‍රතිඵල ලබා නොදුන් විභාග 6 ද ඇතුළුව සියයට 57 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි. එමෙන්ම මෙම පාඨමාලා අතරින්, විගණිත දිනය වූ 2018 ජුනි 20 දින වන විට එක් පාඨමාලාවක කණ්ඩායම් 3 ක් සඳහා වූ විභාග 3 ක ප්‍රතිඵල, මාස 08 ක්ද තවත් පාඨමාලාවක කණ්ඩායම් 3 ක් සඳහා වූ විභාග 3 ක ප්‍රතිඵල පිළිවෙලින් මාස 6, මාස 10 සහ මාස 6 ක් ද ලෙස ප්‍රමාදවී තිබුණි.

(උ) 2016/17 අධ්‍යයන වර්ෂය සඳහා එක් එක් පාඨමාලාවල එකතුව 68 ක ශිෂ්‍ය පුරප්පාඩු පැවති අතර 2017/2018 අධ්‍යයන වර්ෂය වෙනුවෙන්ද ශිෂ්‍ය පුරප්පාඩු 30 ක් පැවතුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය වෙත බඳවා ගතහැකි ශිෂ්‍ය සංඛ්‍යාව, සම්පූර්ණයෙන් බඳවා නොගැනීම හේතුවෙන් පසුගිය වර්ෂ දෙකෙහි විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලැබුණු ශිෂ්‍යයන් පිළිවෙලින් 68 කට හා 30 කට උසස් අධ්‍යාපනය ලැබීමට තිබුණු අවස්ථාව අහිමි වී ගොස් තිබුණි.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන නිවාඩු ලබා 1989 වර්ෂයේදී විදේශ ගත වූ ආචාර්යවරයෙකුගෙන් ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් රු.1,122,267 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩුව විශ්වවිද්‍යාලය විසින් දෙවැනි වරට ආචාර්යවරයාහට විදේශගත වීමට අවසර දීමේදී නිසි පරිදි පරිපාලන ක්‍රමවේදය අනුගමනය කර නොමැතිවීම හේතුවෙන් ගාස්තුවට යටත්ව නිශ්ප්‍රභා කර තිබුණු අතර ගිවිසුම කඩවීම සම්බන්ධයෙන් රු.703,311 ක් හා වැය වී ඇති නඩු ගාස්තු රු.117,300 ක් ලෙස එකතුව රු. 820,611 ක් තවදුරටත් අයකර ගතයුතු වුවද නිලධාරීන්ගේ නොසැලකිල්ල, ප්‍රමාදය, සහ වරද හේතුවෙන් රජයට සිදුවූ පාඩුව අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට 2017 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම් කඩකල ආචාර්යවරයෙකුගෙන් අයකර ගතයුතු රු.4,093,176 ක් ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා පැවරූ නඩුවක් සම්බන්ධයෙන්, ඇපකරුවන් විසින් අත්සන් කරන ලද ගිවිසුමෙහි ඇප වටිනාකම ලෙස අකුරින් රුපියල් හාරලක්ෂ අනූ තුන් දහස් එකසිය හැත්තෑ පහයි ශත පනස් තුනක් ලෙසත් ඉලක්කමින් රු.4,093,176 ලෙසත් සඳහන්කර තිබුණු බැවින්, අකුරින් ලියූ අගය පිළිගැනීම සාමාන්‍ය සම්මතය බවත්, ඇප ගිවිසුමෙහි අකුරින් හා ඉලක්කමින් ලියා ඇත්තේ බැලූ බැල්මට ගිවිසුමෙහි අනෙක් කොටස් සම්පූර්ණ කළ තැනැත්තා නොවන බවත් ඉලක්කමින් ලියූ වටිනාකම නිවැරදි වුවත් නිවැරදි බවට තහවුරු කිරීමට මොරටුව විශ්වවිද්‍යාලය අපොහොසත් වීමත් ඇපකරුවන්, ඇප ගිවිසුම අත්සන් කර ඇත්තේ 2004 ජනවාරි 05 දිනත් ප්‍රධාන ගිවිසුම අත්සන් කර ඇත්තේ 2004 ජනවාරි 14 වීමත් හේතුවෙන් ඇප ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී ප්‍රධාන ගිවිසුම අත්සන් කර නොමැති බැවින් ද එම 2004 ජනවාරි 05 දින වනවිට වලංගු නොවන ගිවිසුමට ඇතුලත් කරුණු සම්බන්ධයෙන් ඇපකරුවන් වගකීමට නොබැඳෙන බවත් අධිකරණ තීන්දුව මගින් ප්‍රකාශයට පත්කර තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලයෙහි වගකිව යුතු නිලධාරීන් විසින් නොසැලකිලිමත්ව වගකීම් විරහිතව කටයුතු කිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) 2002 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර සැලසුම්වල පැවති දුර්වලතාවයන් හේතුවෙන් අතරමග නවතා දමා ඇති "Proposed Multipurpose Auditorium" ව්‍යාපෘතියේ සැළසුම් අදියර වෙනුවෙන් වැයකර තිබුණු රු.1,273,329 ක මූලික වියදම 2017 දෙසැම්බර් 31 දිනටද නොනිම් වැඩ වටිනාකම තුළ ඇතුළත් කර තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 954 ක් හා 881 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 514 ක් හා 667 ක් වීමෙන් පිළිවෙලින් 440 ක් හා 214 ක පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 86 ක් හා 71 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. තවද කථිකාචාර්යවරුන්ගේ පැවති පුරප්පාඩු 230 ක් බාහිර කථිකාචාර්යවරුන් මගින් පිරවීමට කටයුතු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් රු.47,059,364 ක් වැය කර තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 23 දිනැති හා අංක HE/ID/2012/03 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මොරටුව විශ්වවිද්‍යාල පරිපාලන ගොඩනැගිල්ල සඳහා වූ රු.මිලියන 171 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 282 දක්වා සංශෝධනය කිරීමත්, දළ බිම් ප්‍රමාණය වර්ග මීටර් 3950 කින් යුත් පස් මහල් ගොඩනැගිල්ලක් සේ සම්පූර්ණ කිරීමත් ව්‍යාපෘතිය 2012 ආරම්භ කර වසර 2016 දී සම්පූර්ණ කිරීමත් කළයුතු වුවද ඊට පටහැනිව මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකර 2017 වර්ෂයේදී නිමකර තිබුණි.

(ආ) (i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 හා 2007 ඔක්තෝබර් 03 දින නිකුත් කරන ලද අතිරේක 14 හි විධිවිධානයන් පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තුව සියයට 10 ඉක්මවා යනවිට සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු අතර විචලන නියෝග නිකුත් කිරීමට පෙර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමතිය ලබා ගත යුතුය. ඊට පටහැනි ලෙස මුළු පිරිවැය ඇස්තමේන්තුව සියයට 22 ක් ඉක්මවා තිබියදී අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණ අතර එකතුව රු.44,317,130 ක් සඳහා නිකුත් කර තිබුණු විචලන නියෝග 16 ක් සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) නිකුත් කර තිබුණු එකතුව රු.41,906,020 ක් වූ විචලන නියෝග 10 ක් සඳහා ගෙවීම් කර තිබුණද විශේෂ රේටයන් සඳහා උපදේශන ආයතනයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) 2017 සැප්තැම්බර් 06 දින විවෘත කරන ලද ඉහත ගොඩනැගිල්ලේ 2017 අගෝස්තු 30 දින කළ ස්ථානීය පරීක්ෂාවේදී හඳුනාගත් අඩුපාඩු 2018 ජූලි 31 වන විටද සකස් කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ උපදේශනාත්මක සේවාවන් ආයතන වලට සැපයීමේ ආයතනයක් වුවද සිය පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් තම ආයතනය සතු ශිල්පීය හා තාක්ෂණික සේවා දැනුම උපයෝගී කර ගැනීමකින් තොරව රු.4,545,000 ක් වැයකර පෞද්ගලික ආයතනයකින් උපදේශන සේවය ලබාගෙන තිබුණු අතර යෝජිත වාස්තු විද්‍යා ගොඩනැල්ල අදියර ll ඉදිකිරීම සම්බන්ධයෙන් ද රු.මිලියන 5 ක් (වැට් රහිත) වැයකර උපදේශන සේවාව වෙනත් පෞද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (iii) අනුව කොන්ත්‍රාත්කරුට සිදු කරනු ලබන ගෙවීම් වලින් සියයට 90 ක් සම්පූර්ණ වීමට ප්‍රථම සවලීකරන අත්තිකාරම් ලෙස ගෙවූ මුදල සම්පූර්ණයෙන් අයකරගත යුතු වුවද, කොන්ත්‍රාත් වටිනාකම රු.97,672,271 ක් (බදු රහිතව) වූ යෝජිත වාස්තු විද්‍යා ගොඩනැල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියේ අදියර ll සම්බන්ධයෙන්, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.16,995,389 ව්‍යාපෘතිය අවසන් වී මාස 17 ක ප්‍රමාදයකින් පසුව එනම් 2015 අගෝස්තු 06 දින අයකරගෙන තිබුණි.

## 6.1 නොවිසඳී ඇති විගණන ඡේද

-------------------------------

(අ) 2018 අප්‍රේල් 04 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විශ්වවිද්‍යාලය තුළ අනුමතියකින් තොරව පවත්වාගෙන යනු ලබන යුනි කන්සල්ටන්සි සර්විසස් සමාගම සඳහා 2018 අගෝස්තු 13 දින වන විටත් නීත්‍යානුකූල තත්ත්වයක් ඇතිකිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයෙන් පසුව භාණ්ඩ සමීක්ෂණයක් සිදු නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂාවේදී 2018 ජූලි 31 දින වන විටත් පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මොරටුව විශ්වවිද්‍යාලය හා කෝඩ්ජෙන් ඉන්ටර්නැෂනල් සමාගම සමග ඇති කරගත් ගිවිසුම සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාවට ලබාදිය යුතු වුවත් එසේ වාර්තාවක් ලබාදී නොතිබුණි. කෙසේ වෙතත්, මෙම ගිවිසුම සම්බන්ධයෙන් පහත කරුණු ද නිරීක්ෂණය විය.

(i) ඉහත ගිවිසුම ඇතිකර ගැනීම සඳහා තොරතුරු හුවමාරු මාධ්‍යය ලෙස ඊමේල් පණිවිඩ භාවිතා කර තිබූ අතර විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කර ඇති බුද්ධිමය දේපල සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති සංග්‍රහයේ viii කරුණට අනුව විශ්වවිද්‍යාලයේ උපකුලපති යනු බුද්ධිමය දේපල සම්බන්ධයෙන් වූ දෙපාර්ශවයක යම්කිසි කරුණක් සම්බන්ධයෙන් "මැදිහත්කරු" ලෙස ක්‍රියා කරන්නෙකු පමණක් බව සඳහන් වුවද , ඊට අනුකූල නොවන ලෙස මෙම ගිවිසුමට එළඹීම සඳහා ආරම්භයේ සිටම උපකුලපති මූලික වී කටයුතු කර තිබුණි.

(ii) කෝඩ්ජෙන් ආයතනයේ සභාපති මෙන්ම විධායක නිළධාරියා , 2015 අප්‍රේල් 20 දින විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස පත්වී ඇති අතර 2016 ජූලි 16 දිනැති විශ්වවිද්‍යාල උපකුලපතිගේ ලිපිය මගින් වාර 3ක් පාලක සභාවට නොපැමිණීම හේතුවෙන් සාමාජිකත්වය අහෝසි කර තිබුණු අයෙක් බවද අනාවරණය විය.

(ඈ) නව ආපනශාලා සංකීර්ණය සඳහා අවශ්‍ය පුටු හා මේස රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාවලියෙන් බැහැරව කුලී පදනම මත ලබාගැනීම සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුලත කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද 2018 අගෝස්තු 10 දින වනවිටද ඒ අනුව කටයුතු කර නොතිබුණි. විශ්වවිද්‍යාලය විසින් 2011 ජූලි 10 දින පවත්වන ලද මූලික විමර්ශන වාර්තාව අනුව මූල්‍යාධිකාරිද ඇතුළුව 4 දෙනෙකුට කරුණු විමසා විධිමත් පියවර ගැනීම නිර්දේශ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 07 දින 430 වන පාලක සභා තීරණවලට අනුව ඉහත නිලධාරීන්ට චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා අනුමැතිය දී තිබුණද 2017 ජනවාරි 04 දිනැති 431 පාලක සභා අනුමැතියෙන් මූල්‍යාධිකාරිට හැර අනෙක් තිදෙනාට චෝදනා පත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. එම චෝදනාවන්ගෙන් ඔහු නිදහස් කිරීමට තරම් පිළිගතහැකි සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණද පාලක සභාව විසින් ඔහුට විරුද්ධව තිබූ චෝදනා පත්‍ර ඉවත් කිරීමට අනුමැතිය දී තිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව කටයුතු නොකිරීම. |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම. |
| (ඇ) | අරමුදල් කළමනාකරණය | අරමුදල් ඇති කිරීමේ අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ඈ) | ගබඩා පාලනය | ගබඩා පොත්පත් හා බින්කාඩ්පත් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබීම හා විධිමත් අධීක්ෂණයක් සිදු නොකිරීම. |
| (ඉ) | කාර්යමණ්ඩල පරිපාලනය | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුනොකිරීම. |
| (ඊ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම. |
| (උ) | භාණ්ඩ සමීක්ෂණය | විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් ඇතුළු සියළුම අංශ ආවරණය වන පරිදි සමීක්ෂණ සිදු නොකිරීම. |
| (ඌ) | ඉදිකිරීම් කොන්ත්‍රාත් | විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් ක්‍රියාවලියේදී විශ්වවිද්‍යාලයේ උපදේශනාත්මක දැනුම ඒ සඳහා යොදා නොගැනීම. |